# “වංචාවලින් ආරක්ෂා වෙමු” මාසය දියත් කිරීම

අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ

2026 ජුනි 02වන දා ශ්‍රී ලංකා මහ බැංකු සන්ථාගාරයේ දී සිදු කළ කතාව

## හැඳින්වීම

ශ්‍රී ලංකා මහ බැංකුව, දිවයින පුරා සිටින සියලුම ජනතාවගේ මූල්‍ය යහපැවැත්ම සුරක්ෂිත කිරීමේ අරමුණින්, "වංචාවලින් ආරක්ෂා වෙමු" යන තේමාව යටතේ මාසයක් පුරා ක්‍රියාත්මක වන දැනුම්වත් කිරීමේ ජාතික වැඩසටහන අද දින දියත් කරමින් මූල්‍ය වංචා පිළිබඳ මහජන දැනුම්වත්භාවය සහ ඒවායින් ආරක්ෂා වීම තවදුරටත් වැඩි දියුණු කිරීමේ සාමූහික ප්‍රයත්නයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කෙරෙනවා.

## ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන මූල්‍ය වංචා

අද අප ජීවත් වන්නේ මූල්‍ය සේවා සැලකිය යුතු අයුරින් වෙනස් වෙමින් පවතින කාලයක යි. ඩිජිටල් බැංකුකරණය හරහා බැංකු ශාඛාවකින් ලබාගත හැකි බොහෝ සේවා අද සෑම පුරවැසියෙකුටම තම ජංගම දුරකතනය හරහා ලබාගත හැකියි. ඒ වගේම, සමාජ මාධ්‍ය හරහා මූල්‍ය සේවා ඇතුළු භාණ්ඩ හා සේවා වෙත පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව ද ජනතාවට හිමි වී තිබෙනවා.

කෙසේ වුව ද, ලංකාවේ සිදුවන මූල්‍ය වංචාවලට හේතුව වන්නේ ඩිජිටල් බැංකුකරණය, වේගවත් අන්තර්ජාල පහසුකම් හෝ ජංගම දුරකතන භාවිතය ඉහළ මට්ටමක පැවතීම පමණක් ම නොවෙයි. **සියලු දෙනාටම එක හා සමානව නිවැරදි මූල්‍ය තොරතුරු නොලැබීම, ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් නාගරික ප්‍රදේශවලට පමණක් සීමා වීම මෙන්ම සරලව ම පැවසුවහොත් නීත්‍යානුකූල වන්නේ කුමක් ද, ක්‍රමවත් ව නියාමනය වන්නේ කුමක් ද සහ සැබෑ ලෙසම වංචා යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද ආදිය පිළිබඳ ව රටේ බහුතරයක් ජනතාවට අවබෝධයක් නොමැති වීම වැනි අභියෝගාත්මක ගැටලු** ඊට හේතු වී තිබෙනවා.

**නියාමකයින් පනවා ඇති නීතිමය සීමා සහ ජනතාවගේ නොදැනුවත්භාවය අතර පවතින මෙම හිඩැස හේතුවෙන් අයුතු ප්‍රයෝජන ලබාගෙන වංචාකරුවන් අඛණ්ඩව මූල්‍ය වංචාවල නියැලෙනවා.** වංචාකරුවන් නවීන තාක්ෂණයේ සහාය ලබාගන්නා අතර ම ජනතාව තුළ පවතින නොදැනුම්වත් භාවයෙන් ද ප්‍රයෝජන ලබාගන්නවා. එම නිසා, අද අපිට මෙවැනි මූල්‍ය වංචාවලට හසුවන කාණ්ඩ දෙකක් හඳුනාගන්න පුළුවන්. එක් කාණ්ඩයක් නීති විරෝධී ජාවාරමකින් "බලපත්‍රලාභී මුදල් සමාගමක්" වෙන්කර හඳුනාගත නොහැකි පිරිස්. අනෙක් කාණ්ඩය අන්තර්ජාලය ඇතුළු නවීන තාක්ෂණය පිළිබඳ ව මනා දැනුමක් තිබුණ ද නොසැලකිලිමත් බව හේතුවෙන් වංචාකාරි සබැඳි (Links) වෙත පිවිසෙන සහ OTP අංක වෙනත් අය වෙත ලබාදෙන පිරිස් ද වශයෙන්.

අද අප ඉදිරියේ ඇති අභියෝගය දෙයාකාරයි. එක් අතකින්, දිනෙන් දින ඉහළ යන ඩිජිටල් වංචාවලින් අපගේ ජනතාව ආරක්ෂා කර ගැනීම සහ නීති විරෝධී යෝජනා ක්‍රම, විශේෂයෙන්ම අද රට පුරා ව්‍යාප්ත වී තිබෙන වගා ව්‍යාපෘති පිළිබඳ ජනතාවගේ මෙම නොදැනුවත්භාවය දුරු කිරීම යි.

## මූල්‍ය වංචාවල ගෝලීය ව්‍යාප්තිය සහ ඒවායේ බලපෑම

මෙය ශ්‍රී ලංකාවට පමණක් ආවේණික වූ ගැටලුවක් නොවේ. ලොව පුරා සිටින බලධාරීන් මෙන්ම නීති සම්පාදකයින් ද අද මෙම අභියෝගයට මුහුණ දෙමින් සිටිනවා.

ලෝක බැංකුව සහ මූල්‍ය ස්ථායීතා මණ්ඩලය ඇතුළු ජාත්‍යන්තර ආයතන පෙන්වා දෙන ආකාරයට, **මූල්‍ය වංචාවලින් සහ පාරිභෝගිකයින් මුලාවට පත් කිරීමෙන් විනාශ වන්නේ පවුල් සතු ධනය පමණක් නොවෙයි. එයින් සමස්ත මූල්‍ය පද්ධතිය කෙරෙහි ඇති විශ්වාසය ද බිඳ වැටෙන අතර ම ආර්ථිකය යථා තත්ත්වයට පත්කර ගැනීමට මෙන්ම ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව ද ශක්තිමත් කිරීමට පවතින අවස්ථාව අහිමි වනවා.**

විශේෂයෙන් **දියුණු වෙමින් පවතින රටවල**, මෙම මූල්‍ය වංචා හේතුවෙන් ජනතාවට අත්විඳීමට සිදුවන **හානිය විවිධාකාර වේ**. මෙවැනි **මූල්‍ය වංචාවලින් විශාල වශයෙන් පීඩාවට පත් වන්නේ, එම පාඩුව දරා ගැනීමේ හැකියාවක් නොමැති ජනතාවයි**. පිරමිඩ යෝජනා ක්‍රම, වැඩි ලාභ පෙන්වා ජනතාව මුලා කරන ආයෝජන ක්‍රම, නීති විරෝධී තැන්පතු භාරගන්නා ව්‍යාපාර සහ ඩිජිටල් වංචා ක්‍රම හේතුවෙන් පුද්ගලයින්ට මූල්‍ය පාඩු සිදුවනවා පමණක් නොව, **සමස්ත ප්‍රජාවම එක්රැස් කරගත් ඉතුරුම් විනාශ වීමත් සිදුවනවා**. එමෙන්ම **රටේ දුගී බව තුරන් කිරීමට ගන්නා උත්සාහය වසර ගණනක් ආපස්සට ගමන් කරනවා**. මූල්‍ය වංචා කෙරෙහි සාර්ව ආර්ථික දැක්මකින් යුතුව බැලූ විට, මෙම වංචා හේතුවෙන්, බොහෝ කාලයක් තිස්සේ අප දැඩි පරිශ්‍රමයකින් ගොඩ නැඟූ **විධිමත් මූල්‍ය ආයතන කෙරෙහි ඇති ජනතා විශ්වාසය ද දුර්වල වනවා.**

එමෙන්ම **රටක පවතින ආර්ථික අස්ථාවරත්වයෙන් මෙම වංචාකරුවන් උපරිම ප්‍රයෝජන ලබාගන්නා බව** අප මතකයේ තබාගත යුතුයි. මිනිසුන් මූල්‍යමය වශයෙන් අසරණ තත්ත්වයට පත් වූ විට, තමන්ගේ මූල්‍ය ආරක්ෂාව පිළිබඳ ව නොසිතා ක්ෂණික ව මුදල් ඉපැයීමට උත්සාහ කරන විට, වංචාකරුවන් ඉන් ප්‍රයෝජන ලබා ගන්නවා. මෙවැනි තත්ත්වයන් මීට පෙරත් නිරීක්ෂණය වී තිබෙනවා. එම නිසා ඒවා පාලනය කිරීමට **දැන්** පියවර ගත යුතුයි.

මෙම හේතුව නිසා මූල්‍ය පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම, නූතන මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ප්‍රතිපත්තිවල ප්‍රධානම අංගයක් වී තිබෙනවා. ශ්‍රී ලංකාවේ ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපායමාර්ගය මගිනුත් මෙම අවශ්‍යතාව දැඩි ලෙස පිළිගෙන තිබෙනවා.

මෙම පසුබිම තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් **"වංචාවලින් ආරක්ෂා වෙමු"** තේමාව යටතේ මාසයක් පුරා ක්‍රියාත්මක වන පරිදි, මූල්‍ය වංචා පිළිබඳ ව දැනුම්වත් කිරීමේ ජාතික වැඩසටහන දියත් කරනවා.

## ඒකාබද්ධ ජාතික ආරක්ෂාවක්: පාර්ශ්වකරුවන්ගේ භූමිකාව සහ පොදු වගකීම්

කෙසේ වුවද මෙය ශ්‍රී ලංකා මහ බැංකුවට පමණක් තනිව ඉටු කළ හැකි කාර්යයක් නොවේ. විවිධ වූ ආයතන සහ සන්නිවේදන මාධ්‍ය හරහා, සංවිධානාත්මක ලෙස මෙම පණිවුඩය රට පුරා ජනතාව අතරට රැගෙන යැම සඳහා මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන නිර්මාණය කර තිබෙනවා.

**අද මෙම අවස්ථාවට පැමිණ සිටින මාධ්‍යවේදී මහත්ම මහත්මියණි**, අපගේ මෙම පණිවිඩය වඩාත් ඵලදායී ලෙස සමාජයට රැගෙන යා හැකි ප්‍රධනතම පාර්ශ්වයන් අතරින් එක් පාර්ශ්වයක් වන්නේ ඔබයි. ඔබ, **සිදු වූ මූල්‍ය වංචා පිළිබඳ ව වාර්තා කිරීමට පමණක් සීමා නොවී, මූල්‍ය වංචාවලට එරෙහිව ජනතාව දැනුම්වත් කිරීමේ මෙම වැඩපිළිවෙළෙහි ප්‍රධාන පාර්ශ්වකරුවෙක්** ද විය යුතුයි. ඔබ ජනතාව වෙත ලබාදෙන පණිවිඩ මගින්, අපගේ රටේ ජනතාවගේ ජීවනෝපයන් ආරක්ෂා කර ගැනීමට මෙන්ම සමස්ත ජාතියම වංචාවලින් බේරාගැනීමේ හැකියාවක් ද පවතිනවා.

මෙම ආරක්ෂක වැඩ පිළිවෙළෙහි පළමු පෙළ වන්නේ **මූල්‍ය ආයතන සහ මූල්‍ය තාක්ෂණ සැපයුම්කරුවන්. පාරිභෝගිකයින් ඔබ කෙරෙහි තබා ඇති විශ්වාසයත් සමග**, ඔවුන්ට සේවය කිරීමට මෙන්ම ඔවුන් **වංචාවලට හසුවීමෙන් වළක්වා, ආරක්ෂා කිරීමටත්** ඔබට විශාල වගකීමක් පැවරෙනවා.

අප රටේ ජනතාව එකිනෙකට සම්බන්ධ කරන ජාල ක්‍රියාත්මක වන්නේ **විදුලි සන්දේශ සේවා සපයන** සමාගම් හරහායි. නමුත් මේ වනවිට ජනතාව ඉලක්ක කරමින් සිදු කරන වංචාවල දී නිරන්තරයෙන් **මෙම ජාල අවභාවිත වනවා**. මෙයින් පැහැදිලි වන්නේ, අපි සියලු දෙනාම අවධානයෙන් පසුවිය යුතු අතර ම මීට සම්බන්ධ සියලුම පාර්ශ්ව එක්ව කටයුතු කළ යුතු බවයි.

ඩිජිටල් මූල්‍ය ක්ෂේත්‍රය ආරක්ෂා කිරීමේ දී **සයිබර් ආරක්ෂණ බලධාරීන් සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන** සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනවා. ඔබ සමග එක් ව කටයුතු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සූදානම්. ඉදිරියේ දී අපගේ මෙම **සහයෝගය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි** මම විශ්වාස කරනවා.

**ඔබ සතු පුළුල් ප්‍රේක්ෂක ප්‍රසාදය වගකීමෙන් යුතු ව භාවිත කරමින්** මෙම වැඩසටහන සමග එක්වන ලෙස අපේ රටේ සිටින සමාජ මාධ්‍යකරුවන්ගෙන් (**influencers/content creators**) ඉල්ලා සිටිනවා. **වගකීමක් නොමැතිව ජනතාව අතරට යැමෙන් ඔබව විශ්වාස කරන ප්‍රේක්ෂකයින් අවදානමට ලක්වීමේ අවස්ථාවක් පවතිනවා.** එම විශ්වාසය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා ඉදිරියේදීත් ශ්‍රී ලංකා මහ බැංකුව සමග අඛණ්ඩ ව කැප වීමෙන් කටයුතු කරන ලෙසට මම ඔබගෙන් ඉල්ලා සිටිනවා.

**මූල්‍ය විශ්ලේෂකයිනි,** ඔබගේ තක්සේරු කිරීම්, ජනතා ආකල්ප වගේම රටේ ප්‍රතිපත්ති සකස් කිරීමේදීත් බලපෑම් එල්ල කරනවා. එබැවින් නිවැරදි තීරණ මත සිය මූල්‍ය අනාගතය රඳා පවතින සාමාන්‍ය ජනතාවගේ සැබෑ තත්ත්වය වටහා ගෙන, ඒ මත පිහිටා ඔබගේ විශ්ලේෂණ සිදු කිරීම වර්තමාන අවශ්‍යතාවක්.

**ශ්‍රී ලංකා මහ බැංකුවට පමණක් මෙම වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යා නොහැකියි.** කෙසේ වුවද, මූල්‍ය පද්ධතිය, තාක්ෂණික ක්ෂේත්‍රය, මාධ්‍ය සහ නීතිය බලාත්මක කිරීමේ ආයතන එක්ව කටයුතු කළහොත් මේ මොහොතේ අවශ්‍ය වන ඒ ශක්තිමත් සහ සංවිධානාත්මක ආරක්ෂක පවුර ගොඩනැගිය හැකියි.

## ජාතික ඉදිරි ගමන සහ පුරවැසි වගකීම

ග්‍රාමීය ජනතාව, අඩු ආදායම්ලාභී පවුල්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, තරුණ තරුණියන්, පාසල්, විශ්වවිද්‍යාල, සේවා ස්ථාන සහ පොදුවේ නිවාස ඇතුළු **වඩාත් අවදානමට ලක් විය හැකි කණ්ඩායම්** කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, මෙම මූලික පණිවිඩ රට පුරා රැගෙන යාම සඳහා අපි **ඔබගේ සහයෝගය** අපේක්ෂා කරනවා.

මෙම අරමුණ සඳහා, අප පෝස්ටර්, කෙටි චිත්‍රපට, තේමා ගීතය මෙන්ම සාම්ප්‍රදායික හා ඩිජිටල් මාධ්‍ය ඔස්සේ සිදු කරන මාධ්‍ය මැදිහත්වීම් බොහොමයකින් සමන්විත **බහුමාධ්‍ය ප්‍රචාරණ වැඩසටහනක්** සකස් කර තිබෙනවා. ඒ අද වන විට **මිනිසුන්ගේ හැසිරීම් වෙනස් කිරීම සඳහා තොරතුරු ලබා දීමට වඩා සබඳතා ගොඩනැගීම අත්‍යවශ්‍ය** බව අප හොඳින් ම දන්නා බැවිනි.

මෙම වැඩසටහන හරහා, **තමන්ගේ මූල්‍ය යහපැවැත්ම සුරක්ෂිත කර ගැනීම සඳහා පුරවැසියන් සතු වගකීම සහ කාර්යභාරය** අවධාරණය කිරීමට ද අපි අපේක්ෂා කරනවා. මන්ද යත්, තමා ආරක්ෂා කර ගැනීම මෙන්ම **සමස්ත මූල්‍ය පද්ධතියේ අඛණ්ඩතාව සහ ඔරොත්තු දීමේ හැකියාව** සුරක්ෂිත කිරීමට ද සෑම පුද්ගලයෙකුට ම සුවිශේෂී කාර්යභාරයක් පැවරී ඇති බැවිනි.

**සැක සහිත පොරොන්දු පිළිබඳ ව ප්‍රශ්න කරන්න, විශ්වාස කිරීමට පෙර තහවුරු කරගන්න, වගකීමෙන් කටයුතු කරන්න. පුද්ගලික ආරක්ෂාව මෙන්ම සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතිය ම කෙරෙහි මහජනතාව තුළ පවතින විශ්වාසය තහවුරු කිරීම හා ශක්තිමත් කිරීම** සඳහා මෙය අත්‍යවශ්‍ය වනවා.

## ඉදිරි දැක්ම: තිරසර කැපවීම සහ සාමූහික ක්‍රියාමාර්ග

වඩාත් වැදගත් වන්නේ මෙම සාකච්ඡා සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් එක් සතියකට හෝ මාසයකට සීමා නොවී **අඛණ්ඩව පවත්වාගෙන යැමයි. නව වංචා ක්‍රම, නව තාක්ෂණයන් සහ වෙනස්වන පාරිභෝගික හැසිරීම්** සඳහා ගැලපෙන පරිදි මෙම සංවාද සකස් විය යුතු ය.

මෙම පණිවිඩය අපේ රටේ සමස්ත ආර්ථිකය සහ සියලුම ජනතාව වෙත ළඟා වන බව සහතික කිරීම සඳහා ඔබ වැනි සියලුම වගකිව යුතු පාර්ශ්ව සමග සමීපව කටයුතු කරමින් අඛණ්ඩ ව මෙම වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යැමට ශ්‍රී ලංකා මහ බැංකුව බලාපොරොත්තු වනවා.

***අප සියලු දෙනා ම එක් ව 'මූල්‍ය වංචාවලින් ආරක්ෂා වූ' ශ්‍රී ලංකාවක් ගොඩ නගමු.***

ස්තුතියි.